# 9 බලාපොරොත්තුව හා සදාතන ජීවනය

**අපගේ ජීවිත අරමුණු ඉතා ප්‍රයෝජනවත් ලෙස, මෙලොව හා මතු ජීවිතයට යා කෙරෙන්නේ කෙසේද යන්න පිළිබඳවත් අප තුළ තිබිය යුතු ආත්මික වටිනාකම් පිළබඳවත් අවබෝධයක් ලබා ගැනීම මෙම පාඩමින් අපේක්ෂිත ය**

**පිලිප්පි 3: 7-11, රෝම 5: 1-6, 1 පේදුරු 1:13-21**

බලාපොරොත්තුව අපගේ ජීවිතයේ සාමාන්‍ය දෙයකි. සෑම කෙනෙකු තුළ ම බලාපොරොත්තුවක් ඇති වීම ස්වභාවික ය. සාමාන්‍යයෙන් බලාපොරොත්තුවක් ඇතිව ජීවත් වීමේ දී අපට ඇත්තේ සම්පූර්ණ කරගැනීමට අසීරු කාරණා ය. එසේ වන්නේ අසීමිතව බලාපොරොත්තු පොදි බැඳ මේ ජීවිත ගමන අප ගමන් කරන නිසා ය. භෞතික හා ලෞකික බලාපොරොත්තු අපට වැඩි වන තරමට, ඒවායින් යම් ප්‍රමාණයක් ඉටු නො වුනහොත් අපට කලකිරීමක් හා කණස්සල්ලක් ඇතිවෙයි. මෙසේ වූ විට අපේ ජීවිත කඩා වැටීමට ලක් වෙයි. සමහර විටක අප බලාපොරොත්තු නො වූ කාරණා සිදු වන විට, ප්‍රීතිය ද එසේ ම සමහර විට කනගාටුව ද ඇති විය හැකි ය.

කිතුනුවන් ලෙසට මෙම තාවකාලික ලෞකික බලාපොරොත්තුවලින් ඔබ්බට ඇති උසස් බලාපොරොත්තු කෙරේ සිත යොමු කිරීම අවශ්‍ය ය.

අප පැරණි ගිවිසුම දෙස බලන කල ආබ්‍රහම්ගේ ජීවිතය මේ සඳහා නිදසුනකි. ආබ්‍රහම්ට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව පිට ආබ්‍රහම් ඇති කර ගත් ස්ථිර බලාපොරොත්තුව නිසා, ඔහුට විශාල කැපකිරීමක් මෙන් ම ඉවසීමක් ද ඇති කර ගත යුතු විය.

"නුඹේ මව් බිම ද, නුඹේ නෑදෑයන් ද නුඹගේ පියාගේ ගෘහය ද අත්හැර දමා මා පෙන්වන දේශයට යන්න." කියා (උත්පත්ති 12: 1) දෙවියන් වහන්සේ පැවසූ විට ආබ්‍රහම් ඒ අණට කීකරු ව ගමන ආරම්භ කරන ලදී. ඔබ දැනට ම මුල් පාඩමක මෙය අධ්‍යයනය කර ඇත.

එමෙන් ම මෝසෙස් මිසරයේ දුක් විඳිමින් සිටි ජනතාව ඉදිරියේ තැබූ බලාපොරොත්තුව ඉටු කර ගැනීම සඳහා කාන්තාරය මැදින් කටුක ගමනක යෙදුණි. ඔව්හු එසේ යාමට කැමති වීම දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය මත රැඳුණු බලාපොරොත්තුව නිසා සිදු වූවකි.

ආබ්‍රහම් සහ මෝසෙස් තමන්ගේ පෞද්ගලික බලාපොරොත්තු ඉවත දමා දෙවියන්වහන්සේ ඔවුන්ට ඇති කළ බලාපොරොත්තු කෙරේ රැඳෙමින් වෙහෙස වී ක්‍රියා කළහ. දෙවියන්වහන්සේ ඔවුන් සමග අවසානය දක්වා සිටි බව දේව වචනයෙන් පැහැදිලි වෙයි.

කිතුනුවන්ගේ බලාපොරොත්තුව "තමන්ට පමණක්" යන හැඟීමෙන් ගත හැකි බලාපොරොත්තුවක් නොවේ. එය සෑම විට ම දෙවියන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නට පෙලඹෙන බලාපොරොත්තුවකි. මෝසෙස්තුමා විශාල සෙනඟක් කැටුව පාළුකරය මැදින් ගමන් කළේ, දෙවියන්වහන්සේ ඔවුන්ට ප්‍රදානය කිරීමට පොරොන්දු වූ දේශය ලබා ගැනීමේ බලාපොරොත්තුවෙනි. එය මුළු ජනතාවක් තුළම ඇති වූ සාමූහික බලාපොරොත්තුවකි.

කිතුනු අපගේ බලාපොරොත්තුව වන්නේ ක්‍රිස්තුස් වහන්සේ යි. උන්වහන්සේ කෙරේ විශ්වාසය තබන කිතුනුවන්ගේ බලාපොරොත්තුව උන්වහන්සේ හා එක්වීම යි. මෙම බලාපොරොත්තුව සම්පූර්ණ වන දිනයක් පැමිණෙන්නේ ය. ඒ සඳහා අපට උපකාරි වන්නේ දෙවියන් වහන්සේ ය. මේ නිසා එම මහඟු බලාපොරොත්තුව මත තම ජීවිත රඳවා ගැනීමට කිතුනුවා නොඉවසිලිමත් වෙයි.

කියවා බලමු.

## රෝම 5:1-6

"එපමණක් නොව, පීඩා විඳීමෙන් ඉවසීම ද ඉවසිල්ලෙන් තැන්පත් බව ද තැන්පත් බවින් බලාපොරොත්තුව ද උපදින බව දන, අප විඳින පීඩාවල දී වුව ද අපි ප්‍රීති ප්‍රමෝද වෙමු. එබඳු බලාපොරොත්තුවකින්, කිසිම කලකිරීමක් ඇති නොවේ. මන්ද අපට දෙන ලද ශුද්ධාත්මයාණෝ දේව ප්‍රේමයෙන් අපේ සිත් පුරවන සේක." (රෝම 5:4-5)

පීඩා විඳින විට ප්‍රීති ප්‍රමෝද විය හැක්කේ කාහට ද? එසේ කළ හැකි යමෙකු ඇත්නම් ඔහු හෝ ඇය ක්‍රිස්තුස්වහන්සේට හිමි වූවකු වෙයි. එම උසස් බලාපොරොත්තුව ඉෂ්ට කර ගැනීම සඳහා ශුද්ධාත්මයාණන් වහන්සේ දේව ප්‍රේමය අපට ප්‍රදානය කරන සේක.

ඒ සඳහා කිතුනුවාට නොයෙක් අත්දැකීම්වලට මුහුණ දීමට සිදු වෙයි. පාවුල්තුමා රෝම වාසීන්ට විස්තර කරන මෙම බලාපොරොත්තුව තුළ ඇත්තේ ඉවසීම යි. අපගේ බලාපොරොත්තුව මරණයත් සමග නිමා නො වේ. ඒ බව ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිතයත්, මරණයත්, උත්ථානයත් තුළින් පෙන්වා දිය හැකි ය.

මේ අනුව බලන කල දෙවියන්වහන්සේ අපගේ ජීවිතයට උරුම කර දෙන උසස් ම තිළිණය වන්නේ සදාකාල ජීවනය යි.

(පහත සඳහන් බයිබල් පාඨ ද ඔබේ වැඩිදුර අධ්‍යයනට උපකාර වනු ඇත.)

| | |
|---|---|
| ශු. ජොහාන් 17:2 | "මන්ද ඔබ විසින් පුත්‍රයාණන්ට දෙන ලද සියල්ලන් හට සදාකාල ජීවනය දෙන පිණිස සකල මනුෂ්‍ය වර්ගයා කෙරෙහි ආධිපත්‍ය ඔබවහන්සේ පුත්‍රයාණන්ට දුන් සේක. |
| ශු.ජොහාන් 17:3 | "සදාකාල ජීවනය මේ ය.<br>එක ම සැබෑ දෙවිඳුන් වන ඔබ ද,<br>ඔබ විසින් එවන ලද තැනැන්වහන්සේ වන<br>ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ ද දනගැනීම ය." |

අප බලාපොරොත්තු වන සහ අපට උරුම වන සදාතන ජීවනයේ සම්පූර්ණත්වය ජේසුස් වහන්සේ තුළින් අපට ලැබේ. එය ඉෂ්ට කර ගැනීම පිණිස අප තුළ ඇති විය යුතු ජීවිත පරිවර්තනය සඳහා අවශ්‍ය කරුණු තුනක් ගැන දැන් විමසා බලමු.

**කියවා බලමු.**

**පිලිප්පි 3:7-11**

## 1. ධර්මිෂ්ඨකම

ඉහත බයිබල් පාඨය ඉදිරිපත් කිරීමෙන් පාවුල්තුමා, ධර්මිෂ්ඨකමේ ජීවිතයක් අත්පත් කර ගැනීම පිණිස අත්‍යවශ්‍ය කාරණා මෙසේ ඉදිරිපත් කරයි.

පාවුල්තුමා කිතුනුවකු වීමට පෙර විශ්වාස කළේ ව්‍යවස්ථාව පිළිපැදීමෙන් පමණක් සියල්ල උරුම කර ගත හැකි බවයි. නමුත් දෙවියන් වහන්සේ ඔහුට අවබෝධ කරනු ලැබුවේ ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහීම කරණකොට ගෙන ධර්මිෂ්ඨ ජීවිතයක් උරුම වන බවයි.

මාගේ කැමැත්ත

- ක්‍රිස්තුන් වහන්සේ අත් කර ගැනීම
- උන්වහන්සේ සමග ඒකාබද්ධ වීම
- ක්‍රිස්තුන් වහන්සේ කෙරෙහි ඇදහීම
  - ඇදහිල්ල නිසා ධර්මිෂ්ටකම

## 2. ශුද්ධකම

**කියවා බලමු.**

**1පේදුරු 1:13-21**

**ශුද්ධකමේ ජීවිතය**

- ක්‍රිස්තුන් වහන්සේ මරණයෙන් උත්ථාන කොට මහිමයට පත් කළ දෙවියන් වහන්සේ ඇදහීම.
- තෘෂ්ණාවලට වහල් නො වී කීකරු දරුවන් මෙන් හැසිරීම.
- නිෂ්ඵල ජීවිත මාර්ග වලින් මිදීම.
- හැසිරීමෙන් ශුද්ධ ව සිටීම.
- රන් රිදී වැනි දිරායන දේවලින් නොව ක්‍රිස්තුන් වහන්සේගේ දිවි පිදීම තුළින් වේ.
- දේව ගරු බියෙන් ගත කිරීම.

## 3. උතුම් ප්‍රීතිය

**කියවා බලමු.**

**රෝම 5:2**

"තව ද ඇදහිල්ලෙන් අපට ලැබී ඇති මේ දේව වරප්‍රසාදයට පිවිසෙන මඟ අපට සලසා දුන්නේ උන්වහන්සේ ය. ඒ නිසා අපට හිමි වන්ට යන දේව මහිමයේ බලාපොරොත්තු ගැන අපි අතිශයින් ප්‍රීති ප්‍රමෝද වෙමු."

අපි මේ ලෝකයේ නොවැදගත් කාරණා කෙරේ සිත යොදවමින් ප්‍රීතිය ලබන්නට උත්සාහ කරමු. එනමුත් අපට නැති නො වන ප්‍රීතිය ලබා ගැනීමට, සදාතන ජීවනය උරුම කර දෙන ජීවමාන ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ වීම අවශ්‍ය ය.

කිතුනු අපි ක්‍රිස්තුන් වහන්සේ නො දුටු නමුත් උන්වහන්සේට ප්‍රේම කරන්නෙමු. අපි උන්වහන්සේ දැන් නො දකින නමුත් උන්වහන්සේ අදහා ගන්නෙමු. එම ඇදහිල්ල නිසා ම, අපගේ ආත්ම ගලවනු ලබයි. එවිට කියා නිමකළ නොහැකි, තේජාන්විත මහා ප්‍රීතියකින් අපි ප්‍රීති ප්‍රමෝද වන්නෙමු. අපගේ ජීවමාන බලාපොරොත්තුව එය ම ය.

මෙම කරුණු අවබෝධ කර ගැනීමෙන්, අපට පැහැදිලි වන්නේ සදාකාල ජීවනය උරුම කර ගැනීම පිළිබඳව ය. එම කාරණයේ දී ක්‍රිස්තුන් වහන්සේ හා ඒකාබද්ධ වීමෙන්, අපගේ මෙලොව ජීවිතය පරිවර්තනීය ජීවිතයක් කරා ගෙන යා යුතු වෙයි. එම අරමුණ ඉටු කර ගැනීම සඳහා අප තුළ ඇති විය යුතු ධර්මිෂ්ඨකම, ශුද්ධකම හා පරිපූර්ණ ප්‍රීතිය සදාතන ජීවනය කරා අප ගෙන යන මූලික සිද්ධාන්ත වෙයි. මෙලොව අප ගත කරන මරණීය ජීවිතය අමරණීය වන්නේ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමග ඒකාබද්ධ වීමෙනි.

**ක්‍රියාකාරකම්**

1. සදාතන ජීවනය අත්පත් කර ගැනීමට අවශ්‍ය කාරණා නම් කරන්න.

2. ඔබට ඇති විවිධ බලාපොරොත්තු ලැයිස්තු ගත කරමින්, ඉහත පාඩම තුළින් ඉදිරිපත් කරන කිතුනු බලාපොරොත්තුව කුමක් ද යන්න ලියා දක්වන්න.